# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සැකසුම-මාවනැල්ල අධ්‍යාපන කලාපය

# 1 ශ්‍රේණිය - පරිසරය (අගෝස්තු -4 සතිය )

## 11 - තේමාව - අපට ඕනෑ දේ ලැබෙන හැටි

දයාබර දෙමව්පියනි,

එදිනෙදා ජීවිතයේ දී අපේ ආහාර පරිභෝජනය උදෙසා ගෙවත්තේ වගා කළ හැකි දේවල් මොනවාද යන්න දරුවා සමඟ කතා බහ කරන්න. මෙහිදී අත්වන වාසි ලෙස,

- පිරිසිදු, නැවුම් දේ ලබා ගත හැකි බව
- මුදල් ඉතිරි කරගත හැකි වීම.
- මානසික සතුටක් ලැබීම.

ආදී කරුණු පිළිබඳව සරලව දරුවාට කියා දෙන්න.

පුංචි දුවේ පුතේ,

ඔයාටත් පුළුවනි නිවසේ සිටින වැඩිහිටියෙකුගේ උදව් ඇතිව පෝච්චියක හෝ සුදුසු බඳුනක එළවළු පැළයක් සිටුවන්න.

- සිටවූ පැළය නිරීක්ෂණය කිරීමට දරුවා යොමු කරන්න. පැළය වැඩෙන ආකාරය චිත්‍රයට නැගීමට අවස්ථාව සලසන්න.